# බුදුසමය විෂයෙහි තන්ත්‍රවල බලපෑම පිළිබඳ අධ්‍යයනයක්

## A study of the influence of Tantric on Buddhism

කරපික්කඩ සෝභිත හිමි

---

**Abstract**

Among the occultists of the East, the subject of Tantric occupies a very special place. Many scholars are of the opinion that if the beginning of mankind had taken place at some point, the beginning of Tantric would have gone as far back in history. Tantric man primarily used the science of Tantra as a mystical teaching in order to achieve his worldly aspirations. But there is no evidence to say exactly when or by whom this was started. The Tantric Vedic Upanishads, which developed systematically as a mysticism, can also be seen to have used to fulfill religious needs in ancient literary eras. Accordingly, the influence of the regimes gradually increased not only for worldly purposes but also for mundane purposes. As a result, various religious concepts seem to have entered the subject of Tantric.

Many years after the great demised of the Buddha, a new Buddhist tradition based on Tantra began to emerge with the influence of Mahayana Buddhism. But Tantric followers point out that Tantric is a teaching preached by the Buddha himself. For this they have cited various roots of the Buddha period. However, the influence of prehistoric Tantric can be traced back to the prehistoric Tantric Buddhist tradition. The study of inter-sectarian Buddhist thought also reveals that with the gradual development of the Tantra as a new Buddhist tradition in the world today, its impact on the Mahayana tradition as well as on

Theravada has largely increased. This study provides a concise study of the influence of the above disciplines on Buddhism.

**Keywords :-** Tantras, Tantrayana, Theravada, Mahayana, Occultism

**සාරසංක්ෂේපය**

පෙරදිග ගුප්ත ශාස්ත්‍ර අතර තන්ත්‍ර ශාස්ත්‍රයට හිමි වන්නේ සුවිශේෂ ස්ථානයකි. මානව සංහතිය ආරම්භය යම් කලෙක සිදු වී නම් තන්ත්‍ර ශාස්ත්‍රයෙහි ආරම්භය ද ඒතාක් ඈත ඉතිහාසයකට දිව යන බව බොහෝ වියතුන්ගේ මතයයි. ප්‍රාග් ඓතිහාසික මානවයා මූලික වශයෙන් තම ලෞකික අපේක්ෂාවන් ඉටුකර ගැනීම පිණිස තන්ත්‍ර නම් ශාස්ත්‍රය ගුප්ත ඉගැන්වීමක් ලෙස භාවිතා කළහ. නමුත් මෙය කවදා, කවරෙකු විසින් කුමන කරුණක් මුල්කොටගෙන ආරම්භ කරන ලද්දේදැයි නිශ්චිතව සඳහන් කිරීමට සාධක නොමැත. ගුප්ත ශාස්ත්‍රයක් ලෙස ක්‍රමයෙන් සංවර්ධනය වූ තන්ත්‍ර වෛදික උපනිෂද් ආදි සාහිත්‍ය යුග තුළ ආගමික අවශ්‍යතා ඉටුකර ගැනීම පිණිස ද උපයෝගී කොටගත් අයුරු දැකගත හැක. ඒ අනුව ලෞකික අභිමතාර්ථ සඳහා පමණක් නොව ලෝකෝත්තර අරමුණු විෂයෙහි ද තන්ත්‍රයන්ගේ බලපෑම ක්‍රමයෙන් සිදුවිය. එහි ප්‍රතිඵලයක් ලෙස නොයෙකුත් ආගමික සංකල්ප තන්ත්‍ර ශාස්ත්‍රය විෂයෙහි ඇතුල් වූ බව පෙනේ.

බුද්ධ පරිනිර්වාණයෙන් වසර ගණනාවකට පසු තන්ත්‍ර ශාස්ත්‍රය පදනම්ව නව බෞද්ධ සම්ප්‍රදායයක් ආරම්භ වන්නේ මහායාන බුදුසමයේ ඉගැන්වීම්වල ද ප්‍රතිඵලයක් ලෙසිනි. නමුත් තාන්ත්‍රික අනුගාමිකයන් දක්වන්නේ තන්ත්‍රයානය බුදුරදුන් විසින් ම දේශනා කළ ඉගැන්වීමක් බවයි. මේ සඳහා ඔවුහු බුද්ධකාලීන නොයෙකුත් මූලබීජ ගෙනහැර දක්වා ඇත. කෙසේ වෙතත් තන්ත්‍රයාන බෞද්ධ සම්ප්‍රදාය තුළ ප්‍රාග් ඓතිහාසික තන්ත්‍ර ශාස්ත්‍රයේ ආභාෂය බොහෝ සෙයින් දැකගත හැක. එසේම ක්‍රමයෙන් සංවර්ධනය වූ තන්ත්‍රයානය වර්තමානයේ නව බෞද්ධ සම්ප්‍රදායයක් ලෙස ලෝකයේ බොහෝ සෙයින් ප්‍රචලිත වීමත් සමඟ එහි බලපෑම මහායාන සම්ප්‍රදායට මෙන් ම ථෙරවාදයට ද බොහෝ සෙයින් සිදු වී ඇති අයුරු නිකායාන්තර බෞද්ධ චින්තනයන් අධ්‍යයනයේ දී දැකගත හැකි ය. මෙම අධ්‍යයනය

තුළින් උක්ත තන්ත්‍ර ශාස්ත්‍රයෙහි ආභාසය බුදුසමය විෂයෙහි බලපෑ ආකාරය පිළිබඳ සංක්ෂිප්ත අධ්‍යයනයක් සිදුකොට ඇත.

**යතුරු පදඃ-** තන්ත්‍ර, තන්ත්‍රයානය, ථෙරවාදය, මහායානය, ගුප්තශාස්ත්‍ර

**හැඳින්වීම**

මෙම ශාස්ත්‍රීය අධ්‍යයනය තන්ත්‍ර ශාස්ත්‍රය, තන්ත්‍රයානය හා එහි බලපෑම් පිළිබඳ වේ. ප්‍රාග් ඓතිහාසික යුගයේ පටන් ආරම්භ වී යැයි වියතුන් විසින් අදහස් දක්වන තන්ත්‍ර ශාස්ත්‍රයෙහි බලපෑම බුද්ධ පරිනිර්වාණයෙන් පසුව ඍජු ලෙස බුදුසමය විෂයෙහි සිදු වූ බව සිතිය හැක. විශේෂයෙන් මහායාන බුදුසමය තුළ දැක්වෙන ත්‍රිකාය සංකල්පය වැනි ඉගැන්වීම් මෙම තන්ත්‍ර ශාස්ත්‍රයේ ආභාසයෙන් නිර්මාණය වූයේ යැයි පිළිගත හැක. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් බුද්ධ පරිනිර්වානයෙන් වසර දහසකට පමණ පසුව තන්ත්‍රයානය නමින් වෙනම බෞද්ධ සම්ප්‍රදායයක් ද නිර්මාණය වූ අතර එහි බොහෝ සෙයින් අන්තර්ගතව ඇත්තේ තන්ත්‍ර ශාස්ත්‍රය පදනම්ව නිර්මාණය වූ ඉගැන්වීම් ය. මෙසේ තන්ත්‍ර ශාස්ත්‍රය පදනම්ව නිර්මාණය වූ තන්ත්‍රයානයේ ආභාසය ක්‍රමයෙන් ථෙරවාදය තුළට ද ඇතුළත්ව ඇති බව ථෙරවාදී බෞද්ධ සංස්කෘතිය හා සාහිත්‍යය අධ්‍යයනයේ දී දැකගත හැක. අපගේ මෙම ශාස්ත්‍රීය අධ්‍යයනය තුළ බුදුසමය විෂයෙහි ඇතුලත් වූ තාන්ත්‍රික ඉගැන්වීම් කවරේද, ඒ සඳහා බලපා ඇති සාධක කවරේදැයි අධ්‍යයනය කිරීමට අපේක්ෂිත ය.

**පර්යේෂණ ක්‍රමවේදය**

සාහිත්‍ය මූලාශ්‍ර පරිශීලනය කිරීම මගින් තොරතුරු ඒකරාශී කිරීම පර්යේෂණයේ මූලික ක්‍රමවේදය වෙයි. ග්‍රන්ථ සන්ධාර ක්‍රමයට අනුගතව මෙම පර්යේෂණය ප්‍රාථමික මූලාශ්‍රය පරිශීලනය, ද්විතියික මූලාශ්‍රය පරිශීලනය, සඟරා හා කෝෂ ග්‍රන්ථ පරිශීලනය, අන්තර්ජාල පරිශීලනය යන ක්‍රමවේදයන් ඔස්සේ සිදුකොට ඇත.

**සාකච්ඡාව**

තන්ත්‍රයානය හෙවත් තාන්ත්‍රික බුදුසමය ආරම්භ වන්නේ බුද්ධ පරිනිර්වාණයෙන් වසර දහසක් පමණ ඉකුත් වූ පසු බව බොහෝ

වියතුන්ගේ මතයයි. නමුත් ඒ අතර කාලය තුළ විවිධාකාරයෙන් තාන්ත්‍රික ලක්ෂණ බුදුසමය විෂයෙහි බලපා ඇති බවට සාධක සොයාගත හැකි වේ. විශේෂයෙන් තත්කාලීන ආගමික හා සාමාජික පරිසරයට සාපේක්ෂකව එවකට සිටි බෞද්ධ ආචාර්යවරු බුදුදහමේ අඛණ්ඩ පැවැත්ම හා ආරක්ෂාව සඳහා අනුගමනය කළ සුබනම්‍ය ප්‍රතිපත්තියක ප්‍රතිඵලයක් ලෙස තාන්ත්‍රික ඉගැන්වීම් බුදුසමයට එකතු වන්නට ඇතැයි සිතිය හැක. නමුත් බුද්ධකාලීන සමාජ පසුබිම පිළිබඳ විමසා බැලීමේ දී බුදුරදුන් ධරමාන අවධිය තුළ ද තාන්ත්‍රික ලක්ෂණ ප්‍රකටව පැවති බවට නිදසුන් රාශියක් හමු වේ. විශේෂයෙන් වෛදික, බ්‍රාහ්මණ, ආරණ්‍යක, උපනිෂද් සාහිත්‍යයන් තුළ මෙම තාන්ත්‍රික ලක්ෂණ ඇතුළත්ව සංවර්ධනය වීම මේ සඳහා හේතුවන්නට ඇත. බුදුරදුන් පහළ වීමත් සමඟ මධ්‍යම ප්‍රතිපදාව මත බෞද්ධ ඉගැන්වීම් ඉදිරිපත් වුව ද මෙම ගුප්ත ශාස්ත්‍රයේ බලපෑම විවිධාකාරයෙන් බුදුසමය විෂයෙහි ඇතුළත්ව ඇති බව පෙනේ.

තාන්ත්‍රික අදහස් බුදුසමය විෂයෙහි සම්බන්ධවීම අවධි හතරක් යටතේ සිදු වී ඇත.

01. බුද්ධකාලීන පසුබිම තුළ (පැරණි සූත්‍ර හා විනය ඉගැන්වීම් සඳහා)

02. හීනයාන ගුරුකුල විෂයෙහි ඇති වූ බලපෑම

03. මහායාන සූත්‍රවලට ඇතුළත් වීම

04. මහායාන සූත්‍ර, තන්ත්‍ර, මන්ත්‍ර හෝ ධාරණී ලෙස භාවිත කිරීම (නාඔටුන්නේ, 2014: 33).

පැරණි බෞද්ධ ඉගැන්වීම් තුළ ට තන්ත්‍රවල බලපෑම සිදු වූ ආකාරය අවස්ථා දෙකක් යටතේ අධ්‍යයනය කළ හැක.

01. සූත්‍ර පිටකයේ අන්තර්ගත සමහර සූත්‍රවල තන්ත්‍ර, මන්ත්‍ර, ධාරණී පාඨ ඇතුළත් වීම

02. විනය පිටකයේ සමහර විනය නීති තුළින් ගුප්ත ශාස්ත්‍ර ඉගෙනීම, පිළිපැදීම හා ක්‍රියාත්මක කිරීම නොකළ යුතු යැයි පැනවීම

සූත්‍ර පිටකයේ සමහර සූත්‍රවල තන්ත්‍රවල යම් යම් ස්වරූපයන් දක්නට ලැබේ. විශේෂයෙන් දී.නි. ආටානාටිය සූත්‍රය හා මහාසමය සූත්‍රය පිළිබඳ විමසා බැලීමේ දී මෙම සූත්‍ර දේශනා තුළ තාන්ත්‍රික ලක්‍ෂණ රාශියක් දැකගත හැක. නමුත් මෙම සූත්‍ර දෙක පිළිබඳ වියතුන් අතර විවිධ වූ මත පවතියි. ඒවායේ අන්තර්ගත මූලික ඉගැන්වීම් බුද්ධ දේශනාවන් වුවත් පසුකාලීනව එකතු වූ බොහෝ කරුණු එම සූත්‍රවල දක්නට ලැබීමෙන් තාන්ත්‍රික ආභාසය බුද්ධ පරිනිර්වාණයෙන් පසුව එකතු වන්නට ඇතැයි අදහස් ද පවතියි. දී.නි. බ්‍රහ්මජාල සූත්‍රය පිළිබඳ විමසීමේ දී ද භික්ෂූන් වහන්සේලා විසින් වැළකිය යුතු එක් ප්‍රධාන කරුණක් ලෙස දක්වා ඇත්තේ තිරශ්චීන විද්‍යා අධ්‍යයනය හා අනුගමනය කිරීමයි. (දී.නි. 11, බ්‍රහ්මජාල සූත්‍රය, 1956: 20). මෙහි තිරශ්චීන විද්‍යා යටතේ දක්වා ඇති එක් ශාස්ත්‍රයක් නම් තන්ත්‍ර ශාස්ත්‍රයයි. මේ තුළින් ද තන්ත්‍රවල බලපෑම මුල් බුදුසමය තුළ දැකගත හැකි බව පැහැදිලි වේ. ත්‍රිපිටකයේ බොහෝ තැන්වල විවිධ ප්‍රාතිහාර්යය පිළිබඳ කරුණු දැකගත හැක. නිදසුන් ලෙස මහාවග්ගපාලියේ සාමාන්‍ය ප්‍රාතිහාර්ය කිහිපයක් පිළිබඳ සඳහන් වේ. චුල්ලවග්ගපාලියේ පිණ්ඩොලභාරද්වාජ හිමියන් විසින් දැක් වූ ප්‍රාතිහාර්යයක් පිළිබඳ සඳහන් වේ. දී.නි. කේවට්ට සූත්‍රයෙහි හා අංගුත්තර නිකායෙහි ත්‍රිවිධ ප්‍රාතිහාර්යය පිළිබඳ විස්තරයක් දැකගත හැකි ය. සූත්‍ර පිටකයේ ඉද්ධි පාටිහාරිය, ආදෙසනා පාටිහාරිය, අනුසාසනී පාටිහාරිය ලෙස ප්‍රාතිහාර්යය ක්‍රම 03 ක් පිළිබඳ සඳහන් වේ. (නාඹටුන්නේ, 2014: 33). බුදුන් වහන්සේට මෙන් ම ඇතැම් භික්ෂූන් වහන්සේලාට ද මෙම ප්‍රාතිහාර්ය දැක්වීමට හැකියාව තිබූ බව අංගුත්තර නිකායේ දැක් වේ. (දී.නි. 111, ආටානාටිය සූත්‍රය, 1956: 312).

මීට අමතරව විනය පිටකයේ භේසජ්ජක්ඛන්ධකය තුළ දැක්වෙන පරිදි යක්‍ෂ ප්‍රේතාදීන්ගෙන් සිදුවන්නා වූ උපද්‍රවයන් මඟහරවා ගැනීමට හෝ වෙනත් ව්‍යාධීන් සමනය කරගැනීමට හෝ තන්ත්‍ර මන්ත්‍ර භාවිත නොකළ යුතු ය, ඉන්ද්‍රජාලීය සිද්ධාන්ත අනුගමනය නොකළ යුතු ය, ඒවා ප්‍රදර්ශනය නොකළ යුතු ය යනුවෙන් දක්වා ඇත. (මහාවග්ගපාලි භේසජ්ජඛන්ධකය, 1956: 1-55), විවිධ රෝගාබාධ සඳහා බුදුන් වහන්සේ අවසර ලබා දී ඇත්තේ ඖෂධ ප්‍රතිකාර සඳහා පමණි.

මෙම තොරතුරු මඟින් මූලික සූත්‍ර දේශනාවලට මෙන් ම භික්ෂු විනය සඳහා ද තන්ත්‍රවල යම් ආභාසයක් ලැබී ඇති බව පෙනේ. නමුත් මෙය බෞද්ධ තන්ත්‍රයානයේ ආරම්භය ලෙස සැළකිය හැකි නොවේ.

**තාන්ත්‍රික ලක්ෂණ බුදුසමයට ඇතුල්වීමට බලපෑ හේතු**

තාන්ත්‍රික ලක්ෂණ බුදුසමයට ඇතුලත් වීමට බලපෑ මූලික හේතුව ලෙස දැක්විය හැක්කේ සරල වූ පහසු ක්‍රමවේදයක් ඔස්සේ විමුක්තිය ලැබීමට මිනිසා අපේක්ෂා කිරීම යි. ඒ සඳහා ඔවුන් තන්ත්‍ර ශාස්ත්‍රයේ අභාසය ලබා ගැනීමට යොමු වී ඇත.

බෞද්ධ ඉගැන්වීම් තුළ සත්ත්වයාගේ විමුක්තිය පිණිස උපාය මාර්ග 03 ක් දක්වා ඇත.

01. කාය-වාග් සංවර සංඛ්‍යාත සීලය.

02. චිත්ත විශුද්ධිය.

03. දිට්ඨි විශුද්ධිය.(නාඹටුන්නේ, 2014: 33).

සීල විශුද්ධියේ දී ඉතා වැදගත් වූ අංගයක් ලෙස බ්‍රහ්මචර්යාව ආරක්ෂා කිරීම බුදුසමය තුළ දක්වා ඇත. නමුත් බුද්ධ කාලයේ මෙන් ම ඊට පෙර ද බ්‍රහ්මචරියාව පිළිබඳ ඒ තරම් තැකීමක් නොකළ ශ්‍රමණ බ්‍රාහ්මණාදීන් පිළිබඳ තොරතුරු සඳහන් වේ. නිදසුන් ලෙස ඍෂිවරු ස්ත්‍රී පුරුෂ සම්බන්ධය පාපීබවක් ආරෝපණය නොකිරීම, පුරාණ ග්‍රන්ථයන්හි සන්‍යාසි සහ මුණිවරුන්ගේ ලිංගික ක්‍රියා පිළිබඳ සාකච්ඡා වීම, බඹසරින් නොවැළකුණු ඍෂිවරු පහත් වූ තත්ත්වයන්ට නොවැටීම, චාන්දෝග්‍ය උපනිෂදයේ දැක්වෙන වාමදේවගේ ශ්‍රාවකයෝ බ්‍රහ්මචර්යාව නොසැලකීම (ඡාන්දෝග්‍ය උපනිෂද් - 11, 13. 1). ආදිය දැක්විය හැක.

විමුක්තිය අරමුණු කොට නොගත් භික්ෂූහු සමකාලීන අනෙකුත් ඉගැන්වීම් තුළ නිදහස් ප්‍රතිපත්තිය දැක ඊට අනුගත වීමට ගන්නා ලද උත්සහයන් බෞද්ධ මූලාශ්‍රය තුළ දැකගත හැක. ඡන්න භික්ෂුව, ඡබ්බග්ගිය වැනි භික්ෂූන්ගේ ක්‍රියාකලාප මෙයට නිදසුන් ය.

(මහාවග්ග පාලි). මීට අමතරව එසමයෙහි සුරාපානය හා මාංශානුභවය ද සාමාන්‍ය දෙයක් විය. යාග සඳහා මෙන් ම ආහාර සඳහාත් ගවයෝ මරන ලදහ. සුරාවට ආගමේ තැනක් හිමිවිය. එය සෝමපානය නම් විය. යඥකාරකයන් විසින් සෞත්‍රාමණී යඥ වැනි යාගවල දී සුරාව එළිපිට ම ප්‍රයෝජනයට ගන්නා ලදි.

මෙසේ බඹසර ආරක්ෂා කර නොගත්ත ද වෙනත් විවිධ ක්‍රමෝපාය මඟින් එනම් තන්ත්‍ර මන්ත්‍ර ආදිය අනුගමනය කිරීමෙන් විමුක්තිය ලද හැකි බව ඇතැම් පිරිස් විශ්වාස කළහ.

ආධ්‍යාත්මික සංවර්ධනය සඳහා චිත්ත සමාධිය ද අවශ්‍ය වේ. එය චිත්ත විශුද්ධිය ලෙස හැඳින්වේ. බුදුන් වහන්සේට පෙර විසූ ශ්‍රමණයෝ සමාධිය වැඩූහ. කුරු රට විසූ බොහෝ දෙනා සතර සතිපට්ඨානය පිළිබඳව දැනුවත් ව සිටිය හ. සමාධි භාවනාවේ යෙදුණු බොහෝ ශ්‍රමණයන්ට සමාජයෙන් ලැබුණේ මහත් ගෞරවයකි. එසේනම් හුදෙකලාව වනගත පෙදෙස්වලට වී සමාධිය වැඩීමට වඩා මිනිසුන් අතරේ පුද පූජා ද ගෞරවය ද ලබමින් රූක්ෂ ප්‍රතිපදා සහ ගුප්ත බලය ද යොදාගෙන ක්‍රියා කිරීමේ අවශ්‍යතාව සමහර භික්ෂූන්ට දැනුණි.

දිට්ඨි විශුද්ධිය යථාභූත ඥාන දර්ශනය ලබාගැනීමේ පිළිවෙළයි. ඒ සඳහා එක්තරා උපායක් ලෙස සමහර මහණ බමුණෝ භාවිත කළේ මන්ත්‍රයි. බුද්ධ වචනය ද මන්ත්‍ර ලෙස භාවිත කිරීමෙන් දිට්ඨි විශුද්ධිය ලැබිය හැකිදැයි සමහර භික්ෂූහු විමසිලිමත් වූහ. මේ අනුව පැහැදිලි වන්නේ පහසුවෙන් හා ගුප්ත ක්‍රමවේද මඟින් විමුක්තිය ලැබීමේ ක්‍රමෝපායයන් සෙවීම තන්ත්‍ර පිළිබඳ භික්ෂූන්ගේ රුචිකත්වය ලැබීමට හේතු වූ බවයි.

## බෞද්ධ තන්ත්‍රයන්ගේ උදාව

බෞද්ධ තන්ත්‍රයන්ගේ මූලබීජ බුද්ධකාලයේදීම රෝපණය වන්නට ඇතැයි බොහෝ දෙනා පිළිගනිති. ඒ අනුව පසු කාලයේ විසූ බොහෝ ආචාර්යවරයන් විසින් බෞද්ධ තන්ත්‍රයන්ගේ ආරම්භය ද බුදුරදුන්ට ම පවරන ලදි. ඒ සඳහා පදනම් කරගත්තා වූ සාධක කිහිපයක් දැක්විය හැක.

- අලෞකික ශක්තීන් පවා උපදවා ගැනීමට සාමර්ථ්‍ය වූ ඡන්ද, චිත්ත, විරිය, වීමංසා යන ඍද්ධිපාදයන් දේශනාවේ සඳහන් වීම හා එය වැඩීමට බුදුන් වහන්සේ අනුශාසනා කිරීම. (අං.නි. චතුක්ක නිපාත, 494).

- බුදුන් වහන්සේ ඍද්ධි පාටිහාරිය, ආදේශනා පාටිහාරිය, අනුසාසනී පාටිහාරිය යනුවෙන් ප්‍රාතිහාර්යයන් දෙසූ බව ත්‍රිපිටකයේ සූත්‍ර කිහිපයකම සඳහන් වීම

ඍද්ධි ප්‍රාතිහාර්ය - එකෙකු බොහෝ දෙනෙකු සේ පෙනීම හෝ පෙන්වීම, කෙනෙකු තවත් අයට නොපෙනී යෑම, පොළව තුළ කිමිදීම අහසෙහි ගමන් කිරීම ආදියයි.

ආදේශනා ප්‍රාතිහාර්ය - අනුන්ගේ සිත්හි ඇති අදහස් හෝ මනෝභාව ගැන දැනගැනීම, පැවසීම වැනි දේ.

අනුසාසනී ප්‍රාතිහාර්ය - මිනිසා විසින් මේ දේ කළ යුතු ය, මේ දේ හළ යුතු ය, මේ අයුරින් ගුණ ධර්ම දියුණු කළ යුතු ය, යනුවෙන් කරනු ලබන අනුශාසනාවයි.

පිණ්ඩෝල භාරද්වාජ තෙරුන් සඳුන් අරටුවෙන් කළ පාත්‍රයක් ලබාගැනීම පිණිස ඍද්ධි ප්‍රාතිහාර්යක් පැවැත් වූ බව දැනගත් බුදුන් වහන්සේ ඒ ක්‍රියාවේ තුච්ඡ බව උපමාවකින් චුල්ලවග්ගයේ දක්වා ඇත. (චතුක්ක නිපාකත, 494). එහෙයින් බුදුරදුන් උසස් කොට පෙන්වූයේ අනුසාසනී ප්‍රාතිහාර්ය පමණක් බව උන්වහන්සේගේ නොයෙක් දේශනා වලින් පැහැදිලි වේ. එහෙත් මෙහි දී පුදුමයක් මෙන් සඳහන් කළ යුත්තේ උන්වහන්සේ අන්‍ය තීර්ථකයන් හා ආගමිකයන් පැරදවීම සඳහා වරක් ගණ්ඩ නම් අඹ රුකක් මුලදීත් තවත් වරෙක වෛශාලියේදීත් වෙනත් කිහිප අවස්ථාවකදීත් යමක මහා ප්‍රාතිහාර්යය කළ බව පසුකාලවල දී රචනා කරන ලදැයි සිතිය හැකි පොත්පත්වල සඳහන් වීමයි.

බුදුරදුන්ගේ අග්‍ර ශ්‍රාවකයෙකු වූ මුගලන් තෙරුන් ඍද්ධිමත් භික්ෂූන්ගෙනුත්, උප්පලවණ්ණා තෙරණිය ඍද්ධිමත් භික්ෂුණීන්ගෙනුත් අග්‍රබව දැක්වීම සඳහා ඉදිරිපත් කර තිබෙන කථා ද

තාන්ත්‍රික මත ථෙරවාද ත්‍රිපිටකය තුළ නිරූපණය වන බවට නිදසුන් ය. දී.නි. අම්බට්ඨ සූත්‍රයේ හා ම.නි. සච්චක සූත්‍රයේ වජිරපාණි නම් යකෙකු දමනය කළ ආකාරය දක්වා ඇත.

තාන්ත්‍රික ලක්ෂණ බුදුසමයේ විශේෂයෙන් දැකිය හැකි අවස්ථාවක් ලෙස මූලික සූත්‍ර දේශනාවන්ගේද ඇතුළත් පිරිත් සජ්ඣායනය පෙන්වා දිය හැක. පිරිත යනු හාත්පසින් ම ආරක්ෂාව ලබාගැනීමයි. (පරිසමන්තතො තායති රක්ඛතී ති පරිත්තං) මෙසේ ආරක්ෂාව සඳහා පිරිත් සජ්ඣායනා සිදුකිරීම තාන්ත්‍රික බලපෑම නිසා සිදුවූවක් ලෙස සිතිය හැක. මෙය පසුකාලීනව සංවර්ධනය වුව ද බුදුන් දවස පටන්ම භාවිත කොට ඇති අයුරු දැකගත හැක. ආරක්ෂාවට අමතරව මෙත්සිත් පැතිරවීම පිණිස, රෝග නිවාරණය පිණිස, සත්‍යක්‍රියා සිදුකිරීම පිණිස, ත්‍රිවිධ රත්නයේ ආශිර්වාදය ලබාගැනීම පිණිස, ආරක්ෂක මන්ත්‍ර විධියක් ලෙස භාවිත කිරීම පිණිස පිරිත උපයෝගි කොටගෙන ඇත. මේ සඳහා නිදසුන් කිහිපයක් පහත දැක් වේ.

### ඛන්ධ පරිත්ත

මෙය චුල්ලවග්ගපාලියේ දක්නට ලැබෙන සූත්‍ර දේශනාවක් වන අතර අං.නි. අහින්ද සූත්‍රය ලෙස ද සඳහන් වේ. සැවැත්නුවර එක්තරා භික්ෂුවක් නාගයෙකු විසින් දෂ්ඨ කරන ලදුව මියයාම නිසා ආත්මාරක්ෂාව පිණිස මෙම සූත්‍රය දේශනා කොට ඇත. මෙහි දී විරූපක්ඛ, එරාපථ, ඡබ්‍යාපුත්ත, කණ්හාගෝතමක යන අහිරාජ කුලයන් උදෙසා මෛත්‍රිය දැක්විය යුතු බව සඳහන් වන අතර බුද්ධ, ධම්ම, සංඝ යන තුණුරුවන්ගේ ගුණය අනන්ත බව දක්වා ඇත.

> "අනුජානාමි භික්ඛවෙ ඉමානි චත්තාරි අහිරාජ කුලානි මෙත්තෙන චිත්තෙන පරිතුං අත්තගුත්තියා අත්තරක්ඛාය අත්තපරිත්තායාති."

> "අප්පමාණො බුද්ධො අප්පමාණො ධම්මො අප්පමාණො සංඝො"

(බෝදාගම, (සංස්) 2005:),

මෙයට ඛන්ධ පරිත්ත යනුවෙන් දක්වා ඇත්තේ ස්ඛන්ධ පඤ්චකය ආරක්ෂා කරගැනීම සඳහා දේශිත සූත්‍රයක් බැවිනි.

**මෙත්ත සූත්‍රය**

මෙය සුත්ත නිපාතයේ පළමු වරට දක්නට ලැබෙන අතර පසුව එය ඛුද්දකපාඨයට ද ඇතුළත්ව ඇත. මෙම සූත්‍රය හිමාල පර්වතයේ බවුන් වැඩීමට ගිය භික්ෂූන් පිරිසකට රුක් දෙවිවරුන්ගෙන් වූ බිය ගැන්වීම් නිසා එය සමනය කරගැනීම සඳහා දේශිත සූත්‍ර දේශනාවකි.

**බොජ්ඣංග දේශනා**

මහාකාෂ්‍යප තෙරුන් සහ මහමුගලන් තෙරුන් රෝගාබාධ වූ විට බුදුරදුන් උන්වහන්සේලා දැකීමට පැමිණ සුව දුක් විචාරා උන්වහන්සේලාට සති, ධම්මවිචය, විරිය, පීති, පස්සද්ධි, සමාධි හා උපේක්ඛා යන සප්ත බොජ්ඣංග දේශනා කරති. එම දේශනාවන් අසා උන්වහන්සේලාගේ රෝග සුව අතට පත්වී ඇත. මෙම සූත්‍ර මහාකස්සපථෙර බොජ්ඣංග හා මහාමොග්ගලානථෙර බොජ්ඣංග නමින් සංයුත්ත නිකායේ දැක් වේ.

එසේම බුදුරදුන් අසනීප වූ විට මහාචුන්ද හිමියන් බුදුරදුන්ගේ කීම අනුව සප්තබෝජ්ඣංග දේශනා කොට ඇත. ඒ අසා බුදුරදුන්ගේ රෝගාබාධ සුව අතට පත්වූ අතර එය මහාචුන්දථෙර බොජ්ඣංග නමින් දැක් වේ.

**ගිරිමානන්ද සූත්‍රය**

අං.නි. ගිරිමානන්ද සූත්‍රය ආනන්ද තෙරුන් බුදුරදුන්ගෙන් ඉගෙන ගිරිමානන්ද තෙරුන් අසනීප කල උන්වහන්සේ උදෙසා දේශනා කොට ඇත. මෙහි දස සඤ්ඤාවන් ඇතුළත්ව ඇත.

මීට අමතරව අංගුලිමාල පිරිත, රතන සූත්‍රය වැනි දේශනා ආශිර්වාද ලබාගැනීම උදෙසා දේශනා කොට ඇති පිරිත් දේශනාවන් ය. බුද්ධ, ධම්ම, සංඝ යන තෙරුවන් ගුණයෙන් සහ පසේ බුදුවරුන්ගේ ගුණයෙන් ආරක්ෂාව ලැබීම සඳහා ධජග්ග, ඉසිගිලි, චන්ද, සූරිය, මෝර ආදි දේශනා සිදුකොට ඇත.

පසුකාලීනව පිරිත ආරක්ෂක මන්ත්‍ර විධියක් ලෙස භාවිත කරන්නට විය. මේ අවධියේ දී බුදුසමයට තාන්ත්‍රික අදහස් ඍජුවම බලපා ඇති අයුරු දක්නට ලැබේ. මහා සමය, ආටානාටිය, ජිනපඤ්ජරය, අට්ඨවීසති පිරිත, ඇණවුම් පිරිත, ජය පිරිත, සීවලි පිරිත, ගිනි පිරිත, චක්ක පිරිත, ජ්වර පිරිත ආදිය මේ ගණයට ඇතුළත් වේ.

පිරිත් පැන් සහ පිරිත් නූල් ආදිය පසුකාලීනව එකතු වූවක් ලෙස සළකන නමුත් රතන සූත්‍ර දේශනාව සිදුකරමින් ආනන්ද තෙරුන් විශාලා මහනුවර පුරා පිරිත් පැන් ඉසූ බව සඳහන් වේ.

**නිකායාන්තර බෞද්ධ ඉගැන්වීම් තුළින් ප්‍රකටවන තාන්ත්‍රික අදහස්**

ආදි බෞද්ධ ඉගැන්වීම්වලට ගුප්ත විද්‍යා ශාස්ත්‍රවල බලපෑම සිදුවන්නේ නිකායාන්තර බුදුසමය ප්‍රභවය වීමත් සමඟ ය. නිකායාන්තර බුදුසමය ඇතිවන්නේ දෙවන ධර්ම සංගීතියෙන් පසුව මහාසාංඝික නමින් කණ්ඩායමක් සංඝ සංස්ථාවෙන් බිඳී වෙන්වී යාමෙන් අනතුරුවය. පැරණි වාර්තාවලට අනුව මහාසාංඝිකයන් පළමු දෙවන ධර්ම සංගිති තුළ දී සංග්‍රහ කරන ලද බුද්ධ වචනය පිටක 05ක් වශයෙන් සංවර්ධනය කළහ. එනම්

01. සූත්‍ර

02. විනය

03. අභිධර්ම

04. මිශ්‍රක

05. ධාරණී (Edword J, 173,).

මෙහි දැක්වෙන ධාරණී යනු පැරණි තන්ත්‍රවල එක් අවස්ථාවකි. ධාරණී යන වචනය විස්තර කොට ඇත්තේ සූත්‍ර දේශනා සාරාංශ කිරීමෙන් සංස්කරණය කරගත් පහසුවෙන් ධාරණය කරගත හැකි මන්ත්‍රවල ස්වභාවයගත් වචන මාලාවක් ලෙසිනි. (නාඔටුන්නේ, 2014: 36). ධාරණී පද තවදුරටත් කෙටි කිරීමෙන් මන්ත්‍ර යනුවෙන් හඳුන්වන කිසියම් ගුප්ත බලයක් ඇති පද සමූහයක් නිර්මාණය කරගනී.

මිශ්‍රක, ධාරණී පිටක දෙක පිළිබඳ මතවාද කිහිපයක් දැකගත හැකි වේ. මෙම මිශ්‍රක, ධාරණී යන පද දෙකම සංස්කෘත භාෂාවෙන් යෙදී ඇති අතර මහාසාංඝික නිකාය ආරම්භ වූ ක්‍රි.පූ. යුගයේ මෙවැනි තාන්ත්‍රික බලපෑමක් එම නිකායට කෙසේ ඇතුළු වූවේදැයි ගැටලුවක්ව පවතියි. එසේම තන්ත්‍ර එතරම් දියුණු තත්ත්වයක පැවතියේ ද යන්න අනෙක් ගැටලුවයි.

බෞද්ධ චින්තාවේ ඉතිහාසය නම් ග්‍රන්ථයේ දී ඉහත දැක් වූ ආකාරයට පඤ්ච නිකායක් තිබූ බව තහවුරු කොට ඇත. එසේම හියුංසියැන් භික්ෂුව ද ධාරණී මහාසාංඝිකයන්ට අයත් එක් පිටකයක් බව වාර්තා කොට තිබේ. අන්ධක නිකායේ ද මේ පිළිබඳ වාර්තා දැකගත හැකි ය.

නමුත් ඉහත මතු වූ ගැටලුවට පිළිතුරක් ලෙස දැක්විය හැක්කේ තාන්ත්‍රික ඉතිහාසයයි. තන්ත්‍රයන්හි ආදිම අවස්ථාව ප්‍රාග් වෛදික යුගය දක්වා ඈතට දිවයයි. ඉන් පසුව ඇතිව සාහිත්‍ය ක්‍රියාවලියක් ලෙස යුගයෙන් යුගය වැඩි දියුණු වූ වෛදික, බ්‍රාහ්මණ, ආරණ්‍යක, උපනිෂද් ඉගැන්වීම්වලට ද තාන්ත්‍රික ආභාසයෙන් මිදීමට නොහැකි විය. බුදුන් වහන්සේ ද තිරශ්චීන විද්‍යා ලෙස බැහැර කොට ඇත්තේ මෙවැනි ශාස්ත්‍රයන් ය. මෙම නිසා නිරායාසයෙන් ම මහාසාංඝිකයන්ට මෙම තාන්ත්‍රික ආභාසය ලැබෙන්නට ඇතැයි සිතිය හැක. මහාසාංඝිකයෝ ද සංස්කරණය හා නවීකරණය පිළිබඳ දැඩි අවධානයක් යොමු කළ පිරිසකි.

මිශ්‍රක ධාරණී පදයන් මෙම කාලයේ දී බෞද්ධ සාහිත්‍යයට අලුත් වුවත් වෛදික සාහිත්‍යයට අලුත් වූවක් නොවේ. මෙහි දී වෛදික ඉගැන්වීම් පදනම්ව ලෝකෝත්තරවාදී ඉගැන්වීමක් ඉදිරිපත් කළ මහාසාංඝිකයන්ට වෛදික සමයට ඇතුළු වූ තාන්ත්‍රික ලක්‍ෂණවලින් ද මිදී සිටීමට නොහැකි වී ඇත.

මහාසාංඝික නිකායට අමතරව හීනයාන සම්ප්‍රදායට අයත් පූර්ව ශෛලීය අපර ශෛලීය යන නිකාය දෙක මඟින් ද ධාරණී පිළිගත් බව පෙනේ.

මේ ආකාරයට හීනයාන සම්ප්‍රදායට අයත් නිකායයන් තුනක් පැහැදිලිවම තන්ත්‍ර ආභාසය ලබා ඇති බව පැහැදිලි වේ. නිකායාන්තර බුදුසමය තුළ ක්‍රමයෙන් ව්‍යාප්ත වූ තාන්ත්‍රික ආභාසය මහායාන සූත්‍ර රචනාවීමත් සමඟම ඒ තුළින් ද ප්‍රදර්ශනය විය. බොහෝ මහායාන සූත්‍ර දේශනා තුළ ධාරණී පද මන්ත්‍ර පද වශයෙන් සැළකිය හැකි ඉගැන්වීම් රාශියක් දැකගත හැකි ය. මෙය ඉතිහාසය තුළ ක්‍රමානුකූලව සිදු වූ වැඩපිළිවෙලක ප්‍රතිඵලයකි. බුද්ධ දේශනාව සංග්‍රහ කිරීමෙන් අනතුරුව මහායාන සූත්‍ර රචනාවන යුගය දක්වාම එහි විවිධාකාර වූ සංවර්ධනයක් දක්නට ලැබේ. පිටක වශයෙන් පමණක් නොව සූත්‍ර වශයෙන් ද ඉතා සුවිශාල වූ ග්‍රන්ථ සාහිත්‍යයක් මෙම තාන්ත්‍රික ආභාසය පදනම් කොටගෙන නිර්මාණය වී ඇත. මහායාන සූත්‍ර වෛපුල්‍ය සූත්‍ර ලෙස හඳුන්වන්නේ ද මේ තත්ත්වය නිසාය.

මහායාන සාහිත්‍ය තුළ වූ පුළුල් වූ දේශනා සාරාංශ කිරීමේ වැඩපිළිවෙලක් තාන්ත්‍රික ආභාසය නිසාම ඇරඹේ. සමහර මහායාන සූත්‍ර ධාරණියක් මෙන් ම මන්ත්‍රයක් ලෙස ද සකස් වී ඇත. නිදසුන් ලෙස,

අෂ්ටසහශ්‍රිකාප්‍රඥාපාරමිතා සූත්‍රය - සූත්‍ර දේශනාව

ප්‍රඥාපාරමිතාහෘදය සූත්‍රය - ධාරණිය

අල්පාක්ෂරප්‍රඥාපාරමිතා සූත්‍රය - මන්ත්‍ර

ඒකාක්ෂරිප්‍රඥාපාරමිතා සූත්‍රය - මන්ත්‍ර

මීට අමතරව මහායාන සූත්‍ර තුළ දක්නට ලැබෙන තාන්ත්‍රික ලක්ෂණයන්ට නිදසුන් ලෙස සද්ධර්මපුණ්ඩරීක සූත්‍රයේ 21 වන පරිච්ඡේදයේ ධාරණී යන වචනය යෙදී තිබීම ද එහි මන්ත්‍ර ලෙස සැළකිය හැකි පද රාශියක් දක්නට ලැබීම ද පෙන්වා දිය හැක. ලංකාවතාර සූත්‍රයේ ද 09 වන පරිච්ඡේදය ධාරණී යනුවෙන් නම් කොට ඇත. මෙලෙස බොහෝ මහායාන සූත්‍රවල ධාරණී හා මන්ත්‍ර පද එක්වීමෙන් මහායාන ධර්ම සාහිත්‍යයට තන්ත්‍රයන්හි විශාල වූ බලපෑමක් සිදු වී ඇති අයුරු දක්නට ලැබේ. මෙහි දියුණුම අවස්ථාවක් ලෙස ක්‍රි.ව. 01 සියවසේ දී ලියවුණු මංජු ශ්‍රී මූලකල්පය නම් වූ මහායාන සූත්‍රය පෙන්වා දිය හැක. මෙය මහායාන සූත්‍රයක් වුව ද

මහායාන වෛපුල්‍ය සූත්‍ර ගණයට අයත් වේ. මෙහි දැක්වෙන තේමා සුවිශේෂ වේ. ධාරණී, මන්ත්‍ර, මුද්‍රා, මණ්ඩල වැනි මාතෘකා මෙහි දී විශේෂයෙන් සාකච්ඡාවට භාජනය වී ඇත. මෙය මහායාන සූත්‍රයක් වුව ද මෙහි විස්තර වන මාතෘකා පිළිබඳ විමසීමේ දී මෙය තාන්ත්‍රික අදහස් අන්තර්ගත සූත්‍රයක් ලෙස දැක්වීමට හැකියාව ඇත. මෙසේ මෙම සූත්‍ර මඟින් බුදුසමය තුළ තන්ත්‍රයානය බිහිවීමට පෙර ඊට අදාළ වූ පසුබිම සකස් කරන ලද සන්ධිස්ථානයක් ලෙස දැක්විය හැක. තන්ත්‍රයානයේ ආරම්භය පිළිබඳ යම් පූර්ව ලක්‍ෂණයක් මේ සූත්‍රයේ ඉදිරිපත් කරනු ලැබේ. නමුත් මෙම සූත්‍රය කිසිවිටෙකත් තාන්ත්‍රික සූත්‍රයක් ලෙස සැලකිය නොහැක. මංජු ශ්‍රී මූලකල්පය නම් කෘතිය තන්ත්‍රයානය ආරම්භ වීම සඳහා ඍජු පෙළඹවීමක් සිදුකළ නමුදු මෙම ග්‍රන්ථය නිසාම තන්ත්‍රයානය ආරම්භ වූවේයැයි සැළකිය නොහැක. ඒ සඳහා මහායාන සම්ප්‍රදායේ ඇතුළත් සාධක ද පදනම් වී ඇත.

විශේෂයෙන් ක්‍රි.ව. 04 වන සියවස වන විට මහායාන මධ්‍යමක හා විඥානවාදී ඉගැන්වීම් පදනම් කොටගෙන මහායානය තුළ ඉතා ශ්‍රේෂ්ඨ වූ දර්ශන දෙකක් ගොඩනැඟී තිබිණි. මෙය හුදෙක් බුද්ධිමතුන්ගේ මනදොළ සපුරන්නෙකි. මෙම සමය වන විට සාමාන්‍ය ශ්‍රාවකයාගේ හැඟීම් දැනීම් පසුබිම් කොටගෙන ලෞකිකත්වයට නැඹුරු වූ බෞද්ධ ඉගැන්වීමක අවශ්‍යතාව දැඩිව දැනෙමින් තිබිණි. යෝගාචාර විඥානවාදී දර්ශනයේ සාකච්ඡා වන ගැඹුරු දාර්ශනික සංකල්ප කාලාන්තරයක් තිස්සේ වර්ධනය වූ බෞද්ධ දර්ශනයේ උච්චතම අවස්ථාව ලෙස පිළිගැනීමට බොහෝ විචාරකයෝ කැමැත්තක් දක්වති.

තෙවැනි ධර්ම සංගීතියෙන් අනතුරුව දර්ශන සම්ප්‍රදායයක් වශයෙන් බුදුදහම හැඩගැසෙන අයුරු දක්නට ලැබේ. කථාවත්ථුප්පකරණය, මිලින්දප්‍රශ්නය, පේටකෝපදේශය, නෙත්තිප්පකරණය වැනි බෞද්ධ තර්ක පදනම් කොටගත් ග්‍රන්ථ ද, න්‍යාය බින්දුව වැනි තර්ක න්‍යාය පදනම් කොටගත් ග්‍රන්ථ ද, ප්‍රඥාපාරමිතා සූත්‍රය ලංකාවතාර සූත්‍රය වැනි ඥානය හා විඥානය පිළිබඳ ගැඹුරු සංකල්ප විග්‍රහ කරන සූත්‍ර ද ශූන්‍යතාව සහ විඥප්තිමාත්‍රතාව වැනි ගැඹුරු සිද්ධාන්ත පදනම් කරගත් මහායාන නිකායයන් ද ඇති කරන ලද දාර්ශනික පසුබිම විෂය වූයේ බුද්ධිමතුන්ට ය.

නමුත් යෝගාචාර විඥානවාදයේ උච්චතම අවස්ථාවේ දී පෙනෙන එක් ලක්ෂණයක් නම් පැරණි බෞද්ධ මූලාශ්‍රය පදනම් කොටගෙන භක්තිය ප්‍රකට කෙරෙන ඉගැන්වීම් 02 ක් ඉදිරිපත් කිරීමයි. එනම් බෝධිසත්ව සංකල්පය හා ත්‍රිකාය සිද්ධාන්තයයි.

මේ තුළින් බුදුසමයේ භක්තිවාදය ආරම්භ වූ අතර බෝධිසත්ත්ව වන්දනාව සඳහා විවිධ වූ පුද පූජාවන් පමණක් නොව බුදුරදුන්ගේ සම්මුඛතාව වැනි කරුණු ද සාකච්ඡා වී ඇත. මේ සඳහා මූලික වූ තැනැත්තා ආර්ය අසංග පාදයෝ ය. උන්වහන්සේ සමකාලීන ශ්‍රාවක අවශ්‍යතාවන් බැහැර නොකළා සේම මේ වනවිට බුදුසමයට ලැබුණු හින්දු බලපෑමත් සියවස් කීපයක් තිස්සේ නිකායාන්තර බුදුසමය තුළින් විකාශය වෙමින් පැමිණි තාන්ත්‍රික ඉගැන්වීමත් පදනම් කොටගෙන තන්ත්‍රයානයට අවශ්‍ය පසුබිම සැකසෙන්නට ඇතැයි බොහෝ විචාරකයෝ පිළිගනිති. මෙසේ නිකායාන්තර බුදුසමයෙන් ලද ආභාසය මූලික වී මෙම තාන්ත්‍රික බුදුසමයේ ප්‍රභවය සිදු වී ඇත.

**නිගමනය හා සමාලෝචනය**

තන්ත්‍රයානය නමින් බෞද්ධ ආචාර්යවාදයක් පසුකාලිනව නිර්මාණය වුව ද මෙම අධ්‍යයනය තුළින් තන්ත්‍රශාස්ත්‍රයේ ආභාසයන් බුද්ධකාලයේ පටන්ම ආරම්භ වී ඇති බවට සාධක හමු වේ. විශේෂයෙන් සූත්‍ර පිටකයේ මෙන් ම විනය පිටකයේ ද මෙම කරුණ තහවුරු කිරීම සඳහා සාධක බොහෝ දැකගත හැක. නමුත් තන්ත්‍ර ශාස්ත්‍රය තුළ දැකගත හැකි සරල වූ ක්‍රමවේදයන් තුළින් ආගමික අවශ්‍යතාවන් ඉටුකර ගැනීම මත පසුකාලීනව මෙය බුදුසමයට බොහෝ සෙයින් සමීප වන්නට ඇතැයි සිතිය හැක. විශේෂයෙන් මහායාන බෞද්ධ සම්ප්‍රදාය තුළට මෙම ආභාසය ලැබීමත් සමඟ එය සීඝ්‍ර වශයෙන් සංවර්ධනය වූ බව පෙනේ. එසේම මහායාන බුදුසමයේ ද මූලබීජ පදනම්ව පසුකාලීනව නිර්මාණය වූ තන්ත්‍රයානය මෙහි උච්චතම අවස්ථාවයි. එහි ආගමික අවශ්‍යතාවන් සඳහා පමණක් නොව ආරක්ෂාව සළසා ගැනීම ආදී වූ ලෞකික අරමුණු සඳහා ද තන්ත්‍ර උපයෝගී කරගැනීම මත නව අංග රාශියක් බුදුසමයට ඇතුල් විය.

ථෙරවාදය තුළ ද තන්ත්‍ර ශාස්ත්‍රයේ මූලබීජ දැකගත හැකි වුව ද මහායාන ආගමික ඉගැන්වීම පදනම්ව නිර්මාණය වූ තන්ත්‍රයානය පසුකාලීනව සියලු ආගමික චින්තාවන් සඳහා බලපෑම් සිදුකරන්නට සමත් වූයේ තන්ත්‍ර තුළ දැකගත හැකි ඉතා සරල වූ ක්‍රමවේදය හා එහි ඇති ගුප්ත ස්වභාවයයි. ඒ තුළ දැකගත හැකි ආකර්ෂණියබව නිසාම මෙය බෞද්ධයන් අතර ඉතා ඉක්මනින් ජනප්‍රියත්වයට පත් වූ අතර වර්තමානයේ සෑම බෞද්ධ සම්ප්‍රදායයකම පාහේ මෙහි ලක්‍ෂණ බොහෝ සෙයින් දැකගත හැක.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

ධම්මදස්සි හිමි, නායිම්බල, (2964), ටිබේට් බුදුසමය.

ප්‍රඥානන්ද හිමි, ගලගෙදර, (1961), තිබ්බතයේ බොදුසමය, ගුණසේන සමාගම.

රාධක්‍රිෂ්නන්, (1979), භාරතීය දර්ශනය, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

විමලඤාණ හිමි, නාඹටුන්නේ, (2016), තාන්ත්‍රික බුදුසමය, ගොඩගේ සහ සමාගම, කොළඹ.

සාසනරතන හිමි, මොරටුවේ, (1962), ලක්දිව මහායාන අදහස්, අනුලා මුද්‍රණාලය.

සිරි සීවලී, බඹරැන්දේ, (1964), බෞද්ධ ලෝකය, ගුණසේන සමාගම.

Dashupta, S.B." (1958), An Introduction to Tantric Buddhism, University of Culcutta, Culcutta.

E.J. Thomas" (1933), History of Buddhist Thought, London

Lama Thubten Yeshe" (2001), Introduction to Tantra, Wisdom publications.